**ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව**
**இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு**
**HUMAN RIGHTS COMMISSION OF SRI LANKA**

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No. | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date: 18/05/2021 |

පැමිණිලි පාර්ශවය : 01. එම්.එම්.සී. පෙරේරා මහතා.
02. එම්. සංජීවනී පෙරේරා මිය
අංක : 326/ඒ/23, ඉද්ද උයන,
පැලැස්වත්ත, පන්නිපිටිය.

වගඋත්තර පාර්ශවය : 01. පො.ප. ඩබ්ලිව්.ජේ.එස්. නන්දලාල් මහතා,
කොළඹ දකුණ දූෂණ මර්ධන ඒකකය,
පොලිස් ස්ථානය, කිරුළපන.

02. පො.කො. 49979 කේ.සී. හේමසිරි තාබ්රේව් මහතා,
කොළඹ දකුණ දූෂණ මර්ධන ඒකකය,
පොලිස් ස්ථානය, කිරුළපන.

03. පො.කො. 61742 ඩබ්ලිව්.ආර්. ගම්මන්පිල මහතා,
කොළඹ දකුණ දූෂණ මර්ධන ඒකකය,
පොලිස් ස්ථානය, කිරුළපන.

04. පො.කො. 66757 ඒ.එම්.එස්.ඩී.බී. ඒකනායක මහතා,
කොළඹ දකුණ දූෂණ මර්ධන ඒකකය,
පොලිස් ස්ථානය, කිරුළපන.

05. පො.කො. 74081 නන්දන මහතා,
කොළඹ දකුණ දූෂණ මර්ධන ඒකකය,
පොලිස් ස්ථානය, කිරුළපන.

06. පො.කො. 77710 ආර්.එම්.ඩී.පී. කරුණාරත්න මහතා,
කොළඹ දකුණ දූෂණ මර්ධන ඒකකය,
පොලිස් ස්ථානය, කිරුළපන.

<u>පැමිණිලි අංකය : **HRC/415/18, HRC/812/18**</u>



ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R. A. De Mel Mawatha, Colombo - 04.
සභාපති / தவிசாளர் / Chairperson: 011-2505451
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2505541 / 74
ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrcsl@gmail.com

පැමිණිල්ල :-

පැමිණිලි අංක HRC/415/18 යටතේ මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ පැමිණිල්ල ඉදිරිපත් කර ඇති පැමිණිලිකරු සඳහන් කර ඇත්තේ, තම පුතා වන සංජීව පෙරේරා යන අය යතුරු පැදියකින් ගමන් කරමින් සිටියදී සිවිල් ඇඳුමින් සිටි පොලිස් නිලධාරීන් පිරිසක් ත්‍රිවිල් රථයකින් පැමිණ ගැටුමක් ඇති කරගෙන පසුව කිරුළපන පොලිස් ස්ථානයට ගෙන ගොස් අමානුෂික අන්දමින් පහරදී ඇති බවත්, හෙරොයින් ලග තබා ගත්තේ යැයි බොරු චෝදනා ගොනු කර අධිකරණය වෙත ඉදිරිපත් කර ඇති බවත්ය.

පැමිණිලි අංක HRC/812/18 පැමිණිල්ලේ පැමිණිලිකාරිය ද කොමිෂන් සභාව වෙත පැමිණිල්ලක් කරමින් සඳහන් කර ඇත්තේ, තම සහෝදරයා වන එම්. සංජීව පෙරේරා යන අයව යතුරු පැදියකින් ගමන් කරමින් සිටියදී සිවිල් ඇඳුමින් සැරසී සිටි පොලිස් නිලධාරීන් පිරිසක් ත්‍රිවිල් රථයකින් පැමිණ එහිදී සිදුවූ බහින්බස් වීමකින් පසුව කිරුළපන පොලිස් ස්ථානය වෙත රැගෙන ගොස් අමානුෂික අන්දමින් පහරදී හෙරොයින් ලග තබා ගත්තා යැයි චෝදනාව මත අධිකරණය වෙත ඉදිරිපත් කළ බවයි.

මෙම පැමිණිලිකාරිය 2018.08.15 මස 15 වන දින දිවුරුම් ප්‍රකාශයක් ඉදිරිපත් කර ඇති අතර, එම දිවුරුම් ප්‍රකාශයේ තම සහෝදරයාව අත්අඩංගුවට ගෙන අමානුෂික අන්දමින් පහරදී බොරු චෝදනා මත අධිකරණය වෙත ඉදිරිපත් කිරීම සහ තමා පොලිස් ස්ථානයට සහෝදරයා බැලීමට ගිය අවස්ථාවේ එම පොලිසියේ සේවය කරන තන්දන නැමති පොලිස් නිලධාරියා තමාගේ ජංගම දුරකථන අංකය තමාගෙන් ඉල්ලා සිටි බවත්, තමා ඔහුට එය ලබාදුන් බවත්, පසුව තමාට නිතර නිතර දුරකථන ඇමතුම් ලබාදුන් බවත්, ඔහුව හමුවීමට නිදහස් තැනකට එන ලෙසට නිතර ඇවිටිලි කරන ලද බවත්, තමා ඊට විරුද්ධත්වය ප්‍රකාශ කළ බවද සඳහන් කර ඇත. මේ සම්බන්ධයෙන් ජාතික පොලිස් කොමිෂන් සභාව වෙතද පැමිණිලි කල බවත් වැඩිදුරටත් සඳහන් කර ඇත.

වින්දිත පුද්ගලයා වන එම්. සංජීව පෙරේරා යන අයගේ වෛද්‍ය වාර්තාව කැඳවා ඇති අතර, එම වාර්තාවට අනුව රෝගියා විසින් ලබාදෙන කෙටි ඉතිහාසයේ දක්වා ඇත්තේ, 'තමා 2018.02.06 වන දින පස්වරු 1.00 ට පමණ හෙරොයින් ග්‍රෑම් 10 ක් ලග තබා ගැනීම යටතේ අත්අඩංගුවට ගත් බවත්, එම චෝදනාව රෝගියා විසින් පිළිගත් බවත්, පොලිස් නිලධාරීන් ඔහුට පාරේදී පහරදුන් බවත්, පසුව පොලිසියට ගෙන ගොස් පොලු වලින් පහරදුන් බවත්ය'.

මෙම පුද්ගලයාගේ ශරීරයේ තුවාල 08 ක් පවතින බවත්, එම තුවාල බරපතල තුවාල නොවන බවත් දක්වා ඇති අතර, අධිකරණ වෛද්‍යවරයාගේ මතය වන්නේ රෝගියාගේ ඉතිහාසය සහ එම තුවාල වල ස්භාවය ගැලපෙන බවයි.

**වගඋත්තරකරුවන්ගේ කරුණු දැක්වීම :-**

කිරුළපන පොලිස් ස්ථානයේ ස්ථානාධිපති විසින් අත්අඩංගුවට ගැනීම සම්බන්ධයෙන් වාර්තාවක් ඉදිරිපත් කර ඇති අතර, එහි සඳහන් වන්නේ පො.ප. සනත් නන්දලාල් ඇතුළු නිලධාරීන් කණ්ඩායමක් විසින් 2018.02.06 වන දින මෙම සැකකරුව යතුරු පැදියකින් හෙරොයින් ප්‍රවාහනය කරමින් සිටියදී අත්අඩංගුවට ගෙන ස්ථානයට ඉදිරිපත් කළ බවයි.

පළවන වගඋත්තරකාර පො.ප. සනත් නන්දලාල් මහතා කොමිෂන් සභාව ඉදිරියේ ප්‍රකාශ කර ඇත්තේ, 2018.02.06 වන දින කොළඹ දකුණ ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරිවරයාගේ උපදෙස් මත කොළඹ දකුණ කොට්ඨාශ දූෂන මර්ධන ඒකකයේ ස්ථානාධිපති වන තමා 2018.02.06 වන දින පො.කො. 66757 ඒකනායක විසින් පැදවූ අංක : 2017 - 1015 දරණ ත්‍රිවිල් රථය සහ පොලිස් ආරක්ෂක සහායක 112 සංජීව විසින් පදවන ලද ත්‍රිවිල් රථය උපයෝගි කරගෙන පො.කො. 77710 ධනුෂ්ක, පො.කො. 61742 ගම්මන්පිල, පො.කො. 74081 නන්දන, පො.කො. 49979 හේමසිරි සහ පො.කො. 66757 ඒකනායක සමඟ ඔත්තුකරුවෙකු ලබාදුන් තොරතුරක් මත WP BE 6181 දරණ යතුරු පැදියෙන් හෙරොයින් ප්‍රවාහනය කිරීම සම්බන්ධයෙන් සංජීව පෙරේරා යන අයව අත්අඩංගුවට ගැනීමට ගිය බවයි. එම අයව අත්අඩංගුවට ගැනීමට යාමේදී ඔහු පැදයන යතුරු පැදිය පො.කො. 77710 ධනුෂ්ක විසින් අල්ලා නවත්වා ගැනීමට සූදානම් වූ අවස්ථාවේ අත්අඩංගුවෙන් පලායාමට සැකකරු යතුරු පැදිය ක්‍රියාත්මක කිරීම නිසා අත්අඩංගුවට ගත් ස්ථානයේ මාර්ගයේ තිබූ කාණුවකට යතුරු පැදිය සහ සැකකරු පෙරළී ඇද වැටුනු බවත්, පසුව නිලධාරීන්ගේ සහයෙන් සැකකරුව අත්අඩංගුවට ගත් බවත්, සැකකරුව පරීක්ෂා කිරීමේදී සැකකරුගේ කලිසමේ තිබී හෙරොයින් ග්‍රෑ. 21 මි.ග්‍රෑ. 190 ක් සොයා ගත් බවත් දක්වා ඇත. මෙම අත්අඩංගුවට ගැනීම සම්බන්ධයෙන් ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරිවරයා දැනුවත් කළ බවත්, පසුව මෙම සැකකරුට මෙවැනි මත්ද්‍රව්‍ය ප්‍රමාණයක් ලැබුනේ කෙසේද යන්න විමර්ශනය කිරීම සඳහා රැඳවුම් නියෝග ලබාගත් බවත්, මෙම සැකකරු අත්අඩංගුවට ගැනීමට යාමේදී පලා යාමට උත්සහ කිරීමේදී වැටීමෙන් සිදුවූ සීරීම් තුවාල පරීක්ෂා කිරීමට කොළඹ අධිකරණ වෛද්‍යවරයා වෙත ඉදිරිපත් කළ බවත් දක්වා ඇත.

තවද, මෙම සැකකරු නාරාහේන්පිට ප්‍රදේශයේ ප්‍රසිද්ධ හෙරොයින් ජාවාරම්කරුවෙකු වන අමිල යන අයගේ සහයකයෙකු බවට කරුණු අනාවරණය වූ බවද, සැකකරු මාලිගාකන්ද මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කළ බවද වැඩිදුරටත් සඳහන් කර ඇත. මෙම සැකකරු සමග

පුද්ගලික අමනාපකමක් නොමැති බවත්, සැකකරුට පහරදීම සම්බන්ධයෙන් කරන චෝදනා ප්‍රතික්ෂේප කරන බවත්, වැටලීම් කරන නිලධාරින් අධෛර්යමත් කිරීමට මෙසේ පැමිණිලි කරන බවත් වගඋත්තරකරු වැඩිදුරටත් සදහන් කර ඇත.

දෙවන වගඋත්තරකාර පො.කො. 49979 කේ.සී. හේමසිරි නාබ්‍රේව් මහතා ප්‍රකාශ කර ඇත්තේ, 2018.02.06 වන දින පො.ප. සනත් නන්දලාල් මහතාගේ උපදෙස් මත මෙම සැකකරුව අත්අඩංගුවට ගැනීමට සහය වූ බවත්, මෙම සැකකරු මීට පෙර ද ගංජා ලග තබා ගැනීම යටතේ කොහුවල පොලිසිය විසින් අත්අඩංගුවට ගෙන ගංගොඩවිල මහේස්ත්‍රාත් අධිකරණයේ 47705/4 යටතේ නඩුවක් පවරා ඇති බවත්, එසේම පහරදීම සම්බන්ධයෙන් කරන චෝදනා ප්‍රතික්ෂේප කරන බවත්ය.

03, 04 සහ 06 වන වගඋත්තරකරුවන් විසින්ද ප්‍රකාශ කර ඇත්තේ, 2018.02.06 වන දින මෙම සැකකරුව අත්අඩංගුවට ගැනීමට පො.ප. නන්දලාල් මහතාට සහය වූ බවත්, කිසිදු පහරදීමක් නොකළ බවත්ය.

**නිරීක්ෂණ :-**

වින්දිත පුද්ගලයා වන සංජීව පෙරේරා යන අයව 2018.02.06 වන දින කොළඹ දකුණ දූෂණ මර්ධන ඒකකයේ ස්ථානාධිපති ඇතුළු නිලධාරින් කණ්ඩායමක් විසින් අත්අඩංගුවට ගෙන ඇත.

අධිකරණ වෛද්‍ය වාර්තාව අනුව සංජීව පෙරේරා යන අයගේ ශරීරයේ තුවාල 08 ක් ඇති බවත්, එම තුවාල රෝගියා විසින් කරන ලද විස්තරය අනුව ගැලපෙන බවත් අධිකරණ වෛද්‍යවරයා විසින් සදහන් කර ඇති අතර, එම තුවාල පහත පරිදි වේ.

1. 7cm×8cm දකුණු උඩබාහුවේ තැලීමක්.
2. 2cm×2cm ඉහළ පපු ප්‍රදේශයේ පිටුපස තැල්මක්.
3. 2 වන තුවාලයට වන්නට පහළින් 1cm×1cm සීරීමක්.
4. 5cm×5cm දකුණු වැලමිටේ පිටුපස තැලීමක්
5. 16cm×6cm ප්‍රමාණයක තට්ටම පිටුපස ප්‍රදේශයේ තැල්මක්.
6. 16cm×61cm ප්‍රමාණයක වම් කලවේ පිටුපස තැල්මක්.
7. 15cm×10cm ප්‍රමාණයක දකුණු කලවේ පිටුපස තැල්මක්.
8. 7 තුවාලයට පහළින් දකුණු කලවේ පිටුපස 15cm×11cm තරමේ තැල්මක්.

මේ අනුව වින්දිත පුද්ගලයා වන සංජීව පෙරේරා යන අයට වගඋත්තරකරුවන් විසින් පහරදී ඇති බවට නිරීක්ෂණය වේ.

එසේම සැකකරුව 2018.02.07 වන දින ගරු මාලිගාකන්ද මහේස්ත්‍රාත්වරයා වෙත ඉදිරිපත් කර 1984 අංක 13 දරණ විෂ වර්ග අබිං සහ අන්තරාදායක ඖෂධ වර්ග (සංශෝධිත) පනතේ 13 වන වගන්තිය ප්‍රකාරව ප්‍රධාන ප්‍රඥප්තියේ 82(3) යටතේ සැකකරුව වැඩිදුර පරීක්ෂණ කිරීම සඳහා 2018.02.07 දින සිට දින 07 ක කාලයක් රඳවා තබා ගැනීමට රුඳවුම් නියෝග ලබාදෙන ලෙසට ඉල්ලා ඇති බවද නිරික්ෂණය වේ.

එම අවස්ථාවේදී සැකකරුට වගඋත්තරකරුවන් විසින් පහරදුන් බවට ගරු මහේස්ත්‍රාත්වරයාට දැනුම්දීමෙන් අනතුරුව ඔහුගේ තට්ටම් ප්‍රදේශය, අත් වල, කකුල් වල තුවාල නිරීක්ෂණය කර ඇත. ඒ අනුව ගරු මහේස්ත්‍රාත්වරයා පොලිසියෙන් පහරදුන් බවට දක්වා තිබීම මත නැවත පොලිසියේ රඳවා තබා ගැනීමට අවස්ථාවක් ලබාදිය නොහැකි බවට සඳහන් කර ඇති බව නඩු වාර්තාව අනුව නිරීක්ෂණය වේ.

අධිකරණ වෛද්‍යවරයාට ඉදිරිපත් කරන අවස්ථාවේ තමා ලග හෙරොයින් ග්‍රෑම් 10 ක් තිබූ බවට සැකකරු පිළිගෙන ඇති බවද නිරීක්ෂණය වේ.

තවද, සංජීවනී ලක්මාලි පෙරේරා නැමති පැමිණිලිකාරිය කිරුළපන පොලිසියේ විශේෂ විමර්ශන අංශයට තම සහෝදරයා බැලීමට ගිය අවස්ථාවේදී එහිදී දැන හඳුනාගත් පො.කො. 74081 නිලධාරියා ලිංගික අල්ලස් ඉල්ලූ බවට දිවුරුම් ප්‍රකාශයේ සඳහන් වේ. මෙය අපරාධ වරදක් බැවින් අල්ලස් හෝ දූෂණ චෝදනා කොමිෂන් සභාව විසින් හෝ පොලිස් කොමිෂන් සභාව විසින් විමර්ශනය කළ යුතු වරදක් බවට නිරීක්ෂණය වේ.

**නිගමනය :-**

අධිකරණ වෛද්‍ය වාර්තාවට අනුව හා නඩු වාර්තාවේ දක්වා ඇති කරුණු වලට අනුව වගඋත්තරකරුවන් විසින් වින්දිතයාට පහරදීමක් කර ඇති බව තහවුරු වේ. අත්අඩංගුවට ගැනීම සම්බන්ධයෙන් සැලකීමේදී මෙම අය සන්තකයේ හෙරොයින් තිබුණේද යන්න සම්බන්ධයෙන් මේ වනවිට අධිකරණයේ නඩුවක් පවතින බැවින් ද, අධිකරණ වෛද්‍ය වාර්තාවට අනුව රෝගියා විසින් ලබා දුන් කෙටි රෝග ඉතිහාසයේදී ඒ බව සඳහන් කර ඇති බැවින් ද, අධිකරණමය කටයුතු අවසන් වනතුරු ඒ සම්බන්ධයෙන් නිර්දේශයක් නිකුත් කිරීමට හැකියාවක් නොමැති බව නිගමනය කරමි.

සංජීවනී ලක්මාලි පෙරේරා නැමති පැමිණිලිකාරියගෙන් ලිංගික අල්ලස් ඉල්ලූ බවට සඳහන් වන බැවින්, ඒ සම්බන්ධයෙන් විමර්ශනය කිරීම සඳහා අල්ලස් හා දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව වෙත ඒ පිළිබඳව දැනුවත් කිරීම සුදුසු බවද කොමිෂන් සභාව නිගමනය කරමි.

<u>වේලමුරුගේසු එදිරිව නීතිපතිවරයා සහ තවත් අය</u> නඩුවේදී වනසුන්දර විනිසුරුතුමා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11 වන ව්‍යවස්ථාවට අදාළ නිර්දේශ දක්වා ඇත. වධහිංසාව සහ හිරිහැර කිරීම් වලට එරෙහිව ලබාදෙන 11 වන ව්‍යවස්ථාවේ වෙනත් මූලික අයිතිවාසිකම් වලින් වෙන් කොට දක්වන අංග කිහිපයක් ඇත. මෙම ව්‍යවස්ථාව සංශෝධනය කිරීම සඳහා 2/3 ක බහුතරයක් පමණක් නොව ජනමත විචාරණයක් ද අවශ්‍ය වන බැවින් මෙම 11 වන ව්‍යස්ථාව මගින් තහවුරු කර ඇති මූලික අතිවාසිකමෙහි වැදගත්කම තවදුරටත් සුවිශේෂත්වයක් පෙන්නුම් කරයි.

<u>අමල් සුදත් සිල්වා එරෙහිව කොඩිතුවක්කු</u> නඩුවේද දක්වා ඇත්තේ කිසියම් තැනැත්තෙකු වධහිංසාවට හෝ කෲර අමානුෂික හෝ අවමන් සහගත සැලකිල්ලට නැතහොත් දඩුවමකට යටත් නොකළ යුතු බවයි. එසේම, 11 වන ව්‍යවස්ථාව මගින් විධානය කරන්නේ යම් තැනැත්තෙකු විසින් වෙනත් තැනැත්තෙකු වෙත වධහිංසාවක්, කෲර හෝ අමානුෂික සැලකීමක් දැක්වීම තහනම් කරනු ලබන බවයි. එසේම, එම අයිතිවාසිකම කිසියම් සීමාවකට හෝ අඩු කිරීමකට යටත් කර නොමැති පරම මූලික අයිතිවාසිකමක් බවයි. එසේම, අපරාධකරුවෙකු වුවද, එසේ නොවුවද රටේ සැම තැනැත්තෙකුටම මෙම අයිතිවාසිකම ඇති බවත්, මෙම අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට රජයේ අංශයක් වන පොලිස් බලකායට වුවද කිසියම් අවස්ථාගත කරුණක් යටතේ එම අයිතිවාසිකම් ප්‍රතික්ෂේප කිරීම, අඩු කිරීම හෝ සීමා කිරීම නොකළ යුතු බවයි.

එසේම, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අමතරව 1994 අංක 22 දරණ වධහිංසා සහ වෙනත් කෲර අමානුෂික හෝ අවමන් සහගත සැලකීමකට ලක්වීමට එරෙහි සම්මුති පනත මගින් දඩුවම් ආකාරයේ වධහිංසාවක් හෝ පුද්ගලයින්ව කෲර අමානුෂික හෝ අවමන් සහගත සැලකිල්ලකට හෝ දඩුවමකට ලක් කිරීම තහනම් කර ඇත.

ඒ අනුව ඉහත කරුණු සියල්ල සලකා බැලීමේදී 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි 11 වන ව්‍යවස්ථාව මගින් සුරක්ෂිත කර ඇති පැමිණිලිකරුගේ මූලික අයිතිවාසිකම ඉහත වගඋත්තරකරුවන් විසින් උල්ලංඝනය කර ඇති බවට මානව හිමිකම් කොමිෂන් සභාව මෙයින් නිගමනය කරනු ලැබේ.

**නිර්දේශය =:**

01. සියළු වගඋත්තරකරුවන් විසින් වින්දිත පුද්ගලයා වන එම්. සංජීව පෙරේරා යන අය වෙත රු. 30,000/- ක මුදලක් වන්දි වශයෙන් ලබාදිය යුතු බවට මෙයින් නිර්දේශ කරනු ලැබේ.

02. තවද, වගඋත්තරකරුවන්ගේ ක්‍රියාකලාපය සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා මෙහි පිටපතක් පොලිස් කොමිෂන් සභාව වෙත ද යොමු කරනු ලැබේ.

2021. 06. 30 වන දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාව වෙත ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

A. Shanmuganathan

අනුසූයා ෂන්මුගනාදන්,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

Ms. Anusuya Shanmuganathan
Commissioner
Human Rights Commissioner of Sri Lanka

ම.හේ නිමල් කරුණාසිරි,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

Dr. M.H. Nimal Karunasiri
Commissioner
Human Rights Commission of Sri Lanka

පිටපත :- ලේකම්,
ජාතික පොලිස් කොමිෂන් සභාව,
බණ්ඩාරනායක අනුස්මරණ සම්මන්ත්‍රණ ශාලා පරිශ්‍රය,
කොළඹ 07.

B/